# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
# බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2019

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**අ) කොටස ඃ ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්**

I. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයන් තුනම එකවර සමත් වී තිබීම

හෝ

2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඇත්නම් විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

හෝ

II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් මතු දැක්වෙන වෘත්තීය හා වෙනත් සුදුසුකම්

i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් උපාධියක් ලබා තිබීම
ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමනු ලබන වසරකට නොඅඩු ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම (SLQF Level 3 / NVQ Level 5)
iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම
iv) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන නීති පරීක්ෂණයෙන් සමත් වීම

**ආ) කොටස ඃ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව හැදෑරීමට විෂයයන් තෝරා ගැනීම**

| සංකේත අංකය | විෂයය |
|---|---|
| 01 | බෞද්ධ ශිෂ්ටාචාරය (Buddhist Civilization) |
| 02 | බෞද්ධ දර්ශනය (Buddhist Philosophy) |
| 03 | නර්තනය (Dancing) |
| 04 | නාට්‍ය හා රංග කලාව (Drama and Theatre) |
| 05 | ඉංග්‍රීසි (English) |
| 06 | සංස්කෘතිය හා සෞන්දර්ය අධ්‍යයනය (Culture and Aesthetic Studies) |
| 07 | සංගීතය (Music) |

| | |
|---|---|
| 08 | පාලි (Pali) |
| 09 | සිංහල (Sinhala) |
| 10 | සංස්කෘත (Sanskrit) |
| 11 | හින්දි (Hindi) |
| 12 | මානව විද්‍යාව (Anthropology) |
| 13 | පුරාවිද්‍යාව (Archeology) |
| 14 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය (Communication and Media Studies) |
| 15 | අපරාධ විද්‍යාව (Criminology) |
| 16 | ආර්ථික විද්‍යාව (Economics) |
| 17 | භූගෝල විද්‍යාව (Geography) |
| 18 | ඉතිහාසය (History) |
| 19 | ජාත්‍යන්තර සම්බන්ධතා (International Relationships) |
| 20 | දර්ශනය (Philosophy) |
| 21 | දේශපාලන විද්‍යාව (Political Science) |
| 22 | මනෝ විද්‍යාව (Psychology) |
| 23 | සමාජ සංඛ්‍යානය (Social Statistics) |
| 24 | සමාජ විද්‍යාව (sociology) |

i. ඉහත දක්වා ඇති විෂයයන්ගෙන් විෂයයන් 03 ක් තෝරාගත යුතුය.

ii. **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ විෂයයක් වශයෙන් සංගීතය හෝ නර්තනය සඳහා ලියාපදිංචි වීමට නම් විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ ද සමත්වීම අනිවාර්ය වේ.** ප්‍රායෝගික පරීක්ෂණයෙන් අසමත් වන සිසුන්ට ඒ වෙනුවට වෙනත් විෂයයක් තෝරා ගත හැකිය.

iii. **නර්තනය විෂයය සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් ප්‍රායෝගික පුහුණු සඳහා අමතර ගාස්තුවක් අය කෙරේ.**

iv. **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ** විෂයයක් වශයෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය.

v. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂාව හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :

- අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තම ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය (විෂයය අංක 73) හදාරා අවම වශයෙන් 'S' සාමාර්ථයක් ලබා තිබීම.
- අනෙකුත් සියළුම අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි හා වාග් විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.